**ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය**

**කොළඹ**

**පුවත්පත් නිවේදනය**

**ඉන්දියාවෙ උපාධි පාඨමාලා සඳහා ශිෂ්‍යත්ව පිරිනැමීම**

පහත සඳහන් ශිෂ්‍යත්ව යෝජනා ක්‍රම සඳහා ඉල්ලුම් කළ යුතු අවසාන දිනය 1) නේරු අනුස්මරණ ශිෂ්‍යත්ව යෝජනා ක්‍රමය: ඉංජිනේරු, විද්‍යා, ව යාපාර, ආර්ථික විද්‍යාව, වාණිජ, මානව ශාස්ත්‍ර හා කලා ඇතුළු සියලුම උපාධි පාඨමාලා (වෛද්‍ය / පරිපූරක වෛද්‍ය හා විලාසිතා නිර්මාණ පාඨමාලාවන් හැර ) සහ 2) රජීව් ගාන්ධි ශිෂ්‍යත්ව යෝජනා ක්‍රමය : ඉන්දියානු රජය විසින් සපයනු ලබන B.E හෝ B.Tech උපාධියකට යොමු වන ‘තොරතුරු තාක්ෂණ’ ක්ෂේත්‍රයේ උපාධි පාඨමාලා සඳහා අයදුම් කළ හැකි කාලය 2020 ජනවාරි 6 වන දින දක්වා දීර්ඝ කර ඇත. කලින් අවසාන දිනය වූ 2019 දෙසැම්බර් 16 වෙනිදාට පෙර අයදුම් කිරීමට නොහැකි වූ සිසුන්ට නව අවසාන දිනට පෙර අයදුම් කළ හැකිය.

අවශ්‍ය තොරතුරු උසස් අධ්‍යාපන , තාක්ෂණ හා නවෝත්පාදන අමාත් යාංශයේ වෙබ් අඩවිය වන www.mohe.gov.lk වෙබ් අඩවියෙන් ලබා ගත හැකිය. උසස් අධ්‍යාපන, තාක්ෂණ හා නවෝත්පාදන අමාත්‍යාංශය වෙත ඉහත පාඨමාලා සඳහා අයදුම්පත් භාරදිය යුතු අවසාන දිනය 2020 ජනවාරි 6 දක්වා දීර්ඝ කර ඇත.

අවශ්‍ය සුදුසුකම් සහ තෝරා ගැනීමේ ක්‍රියාපටිපාටිය පිළිබඳව වැඩිදුර දැන ගැනීම සඳහා අනාගත සිසුන්ට උසස් අධ්‍යාපන , තාක්ෂණ හා

නවෝත්පාදන අමාත්‍යාංශයට හෝ කොළඹ ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලයට පැමිණෙන ලෙස උපදෙස් දෙනු ලැබේ.

***

2020 ජනවාරි 01